සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

28950

## 8 - ශ්‍රේණිය

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

නම/විභාග අංකය:- ......................................................................................... කාලය: පැය 2යි.

සැලකිය යුතුයි :- ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50ක් හිමිවන අතර, ඉතිරි ලකුණු 50 වර්ෂය තුළ දී සිදු කරන ලද පාසල් පාදක ඇගයීම් මත ලබාදෙනු ඇත.

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. I කොටසේ සියලුම ප්‍රශ්නවලටත්, II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් ද පිළිතුරු සපයන්න.

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. තවාන් මඟින් පැළ ලබාගන්නා බෝගයකි,
   1. මෑ 2. බණ්ඩක්කා
   3. මිරිස් 4. කව්පි

2. පෝෂක මාධ්‍යය ලෙස ඇල්බට් මිශ්‍රණය යොදාගෙන බෝග වගා කිරීමේ ක්‍රමය,
   1. කුට්ටි තවාන නම් වේ. 2. බිමමල් වගාව නම් වේ.
   3. නිර්පාංශු වගාව නම් වේ. 4. කෙටිකාලීන වගාව නම් වේ.

3. ශාක ප්‍රෝටීන් බහුල ආහාරයකි,
   1. සෝයාබෝංචි 2. බත්
   3. පොල් 4. කොස්

4. ආහාරයක, ඇඹුල් රසය ඇති කිරීම සඳහා යොදා ගනු ලබන ද්‍රව්‍යයකි,
   1. ලුණු 2. මිරිස්
   3. සියඹලා 4. ගම්මිරිස්

5. නිර්පාංශු වගාවේ දී, ඝන මාධ්‍යය වශයෙන් භාවිත කළ හැකි ද්‍රව්‍යයකි,
   1. ගොම 2. කොහුබත්
   3. අළු 4. දිරාගිය කොළරොඩු

6. වගා බිමට වසුන් යෙදීමෙන් බලාපොරොත්තු වන්නේ,
   1. පාංශු ඛාදනය අවම කිරීම ය. 2. පසේ ව්‍යිපළි බව ආරක්ෂා කිරීම ය.
   3. රෝග මර්ධනය කිරීම ය. 4. පිරිසිදු කිරීම ය.

7. කෙටිකාලීන එළවළු බෝගයක් නොවන්නේ,

1. කරවිල ය.
2. වැටකොළු ය.
3. පතෝල ය.
4. දඹල ය.

8. පිටිමෝලි සෑදීමේ දී යොදා ගන්නා පිපුම් කාරකයක් නොවන්නේ,

1. යීස්ට් ය.
2. ලුණු ය.
3. බේකින් පවුඩර් ය.
4. බිත්තර ය.

9. පොලිප්‍රොපිලීන් යොදා ගන්නේ,

1. ආහාර ගබඩා කිරීමේ දීය.
2. ආහාරවල ජලය ඉවත් කිරීමේ දීය.
3. ආහාර ඇසුරුම් කිරීමේ දීය.
4. පරිරක්ෂිත ආහාර නිපදවීමේ දීය.

10. කුඩා පරිමාණ ව්‍යාපාරයකි,

1. මෝටර් රථ නිෂ්පාදනය.
2. ඉදල් නිෂ්පාදනය.
3. ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය.
4. මහන යන්ත්‍ර නිෂ්පාදනය.

11.  මෙම සංකේතයෙන් දැක්වෙනුයේ,

1. බල්බයකි.
2. කෝෂයකි.
3 ධාරිත්‍රයකි.
4. ප්‍රතිරෝධයකි.





12. මහන මැෂිමක ජවරෝදය හා තුලා රෝදය අතර සබඳතාවය ඇති කරනුයේ,

1. ඉද්ද මඟිනි.
2. කුවට මඟිනි.
3. ලීවරය මඟිනි.
4. පටිය මඟිනි.

13. විදුලි පරිපථ සකස් කිරීමේ දී අත්‍යවශ්‍ය වේ ,

1. යතුර හෙවත් ස්විචය
2. උල් අඬුව
3. විවිධ සනකමින් යුත් රැහැන්
4. විදුලි පාහනය

14. ට්‍රාන්සිස්ටරයක සංකේත සටහන වන්නේ, මින් කුමක් ද?

1. 
2. 
3. 
4. 

15. වෙළෙඳපොළ හිදැසක් යනු,

1. ව්‍යාපාරයක සිදුරක් ඇති වීමයි.
2. ව්‍යාපාරය අතහැර දැමීමයි.
3. අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තු ගත කිරීමයි.
4. වෙළෙඳපොළ අවස්ථාවක් ඇති වීමයි.

(ආ) පහත දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

16. වගා බිමේ දී ................................................ දුටු වහාම ඉවත් කළ යුතුය.

17. සත්තු නිදහසේ ආහාර සොයා ගැනීම ................................................ නම් වේ.

18. වට්නි සෑදීමට පෙර තක්කාලි ................................................ කිරීම කළ යුතුයි.

19. විධිමත් වෙළෙඳ ශිල්පීය ක්‍රමයකි, ................................................ කිරීම.

20. ප්‍රතිරෝධයක අගය මැනීම සඳහා ................................................ නැමැති ඒකකය භාවිත කරයි.

(බිලාන්ව්, ඕම්, වල් පැළෑටි, ඇසුරුම්, නිදැලි ක්‍රමය) (ලකුණු 1 x 20 = 20)

## II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

1. (අ) 'භූමි අලංකරණය' යනු කුමක්දැයි හඳුන්වන්න.
   (ආ) 'භූමි අලංකරණය' සඳහා යොදාගනු ලබන, උපාංග පහක් ලියන්න.
   (ඇ) භූමි අලංකරණයේ දී, භූමියේ, ශාක සිටුවීමට පෙර හා පසු සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 07 ½)

2. (අ) කුළුබඩු ඇසුරුම්කරණය සඳහා, වඩාත් උචිත ද්‍රව්‍ය දෙකක් ලියන්න.
   (ආ) එදිනෙදා භාවිතයට ගන්නා, කුළුබඩු වර්ග පහක් ලියන්න.
   (ඇ) ඇසුරුම් කිරීමට යොදා ගන්නා බෝතල්, ජීවාණුහරණය කිරීම අත්‍යවශ්‍යය. ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය ලියන්න. (ලකුණු 07 ½)

3. (අ) නිවෙස්වල භාවිත කරන උපකරණ, ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. ඒවා නම් කරන්න.
   (ආ) මහන යන්ත්‍රයක කොටස් පහක් නම් කරන්න.
   (ඇ) විදුලියෙන් ක්‍රියා කරන ගෘහ උපකරණ භාවිතයේ දී, ආරක්ෂාව පිළිබඳව ඔබ දැනුවත් විය යුතු කරුණු තුනක් ලියන්න.

(ලකුණු 07 ½)

4. (අ) ව්‍යාපාරික අදහසක් මතු කරගැනීමට කළ හැකි, 'වෙළෙඳපොළ සමීක්ෂණය' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ආ) ව්‍යාපාරවල හිමිකාරත්වය අනුව, ව්‍යාපාර සංවිධාන ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. ඒ මොනවා ද?

(ඇ) අවිධිමත් ව්‍යාපාර සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 07 ½)

5. (අ) කෙටිකාලීන බෝග, වගා කිරීමෙන් ඇති වන වාසි දෙකක් ලියන්න.

(ආ) බීජ තවාන් කර පැළ ලබාගැනීමේ වාසි දෙකක් ලියන්න.

(ඇ) මාෂබෝගවල ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 07 ½)

*..............*